ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

අදියර II විභාගය - 2024 ජනවාරි

## (201) උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය
(Advanced Financial Accounting & Costing)

---

## A කොටස

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නයට ලකුණු 25ක් වෙන් කර ඇති අතර එය අනු ප්‍රශ්න වලින් සමන්විත විය. විෂය නිර්දේශය යටතේ උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැය ආවරණය වන පරිදි දැනුම පරීක්ෂා කර ඇත. සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට හැකි වූයේ ඉතා සුළු පිරිසකට පමණක් වන අතර බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10 - 20ක් ලබා ගෙන තිබුණි.

උත්තරවල පහත පොදු දුර්වලතා සහ වැරදි නිරීක්ෂණය කරන ලදී:

1.1 ප්‍රශ්නය පිරිවැය ගිණුම්කරණ සංකල්පය පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලද අතර බොහොමයක් අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු දි ඇත. තවද, සමහර අයදුම්කරුවන් පිරිවැය ගිණුම්කරණයට අදාළව නිවැරදි ප්‍රකාශය හඳුනා ගැනීමට අපොහොසත් වූ බව සඳහන් කල යුතුය.

1.2 ලබා දී ඇති තොරතුරු මත පදනම්ව නිෂ්පාදන සමාගමක උපරිම තොග මට්ටම ගණනය කිරීම ප්‍රශ්නයෙන් අසන ලදී. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු ලබා දී ඇති අතර, අයදුම්කරුවන් ඉතා සුළු පිරිසක් වෙන් කර ඇති ලකුණු ලබා ගැනීමට අසමත් වුහ. අවම තොග මට්ටම ගණනය කිරීම සඳහා භාවිතා කරන නිවැරදි සූත්‍රය ඔවුන් නොදැන සිටි බව සඳහන් කල යුතුය.

1.3 සීමාසහිත පුද්ගලික සමාගමක ලක්ෂණ පිළිබඳව ප්‍රශ්නය මගින් පරීක්ෂා කරන ලදී. අපේක්ෂකයින් බොහෝ දෙනෙක් හොඳින් පිළිතුරු සපයා ඇත.

1.4 මෙම ප්‍රශ්නය සමාගමක පොදු කාර්ය පිරිවැය අවශෝෂණය කිරීම පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලද අතර පොදු කාර්ය පිරිවැය අවශෝෂණය පිළිබඳ සමහර අයදුම්කරුවන්ගේ දැනුම එතරම් සතුටුදායක නොවිය. පොදු කාර්ය අවශෝෂණ අනුපාතය ගණනය කිරීමේදී ඔවුන් අයවැයගත පොදු කාර්ය පිරිවැය වෙනුවට සත්‍ය පොදු කාර්ය පිරිවැය යොදාගෙන ඇත.

1.5 ආර්ථික ඇණවුම් ප්‍රමාණය ගණනය කිරීම සඳහා වන සූත්‍රයේ උපකල්පනයක් තේරීමට ප්‍රශ්නය අසන ලද අතර බොහෝ අයදුම්කරුවන් හොඳින් පිළිතුරු දි ඇත.

1.6 මෙමගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කරන ලදී. බොහොමයක් අයදුම්කරුවන් හොඳින් පිළිතුරු දි ඇති අතර, අයදුම්කරුවන් ඉතා සුළු පිරිසක් සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට අසමත් වී ඇත.

1.7 1890 හවුල් ආඥා පනතේ 24 වගන්තියේ විධිවිධාන දෙකක් (02) සඳහන් කරන ලෙස ඉල්ලා සිටි අතර බොහොමයක් අයදුම්කරුවන් අවශ්‍ය පරිදි පිළිතුරු දී තිබුණි.

1.8 හවුල් ව්‍යාපාරයක තොරතුරු මත පදනම්ව, කැපකිරීමේ අනුපාතය ගණනය කරන ලෙස ඉල්ලා ඇත. සමහර අයදුම්කරුවන් කැපකිරීමේ අනුපාතය නිවැරදිව ගණනය කළද, මෙම විෂය පථය පිළිබඳ දැනුම නොමැතිකම නිසා බහුතරයක් නිවැරදිව ගණනය කර නොමැත.

**1.9** ලබා දී ඇති තොරතුරු මත පදනම්ව, පුද්ගලික සමාගමක් විසින් ගෙවනු ලබන ශුද්ධ වැටුප ගණනය කරන ලෙස ඉල්ලා සිටි අතර සමහර අයදුම්කරුවන් ගෙවා ඇති ශුද්ධ වැටුප නිසි ලෙස ගණනය කර නොමැති බව හඳුනා ගැනුණි. සමහර අයදුම්කරුවන් බදු අඩු කිරීම් දළ වැටුපෙන් අඩු කර නොතිබුණි. ඒ වගේම, සමහරු ශුද්ධ වැටුප ගණනය කිරීමේදී සේවක භාරකාර අරමුදල් දායකය වන 3% අඩු කර ඇත.

**1.10** ප්‍රශ්නය LKAS 10 හි මූලික දැනුම පරීක්ෂා කර ඇති අතර LKAS 10 අනුව ගලපනු ලබන සිදුවීම් සඳහා උදාහරණ තුනක් සඳහන් කරන ලෙස ඉල්ලා ඇත. සමහරු ලාභාංශ ප්‍රකාශ කිරීම ගැලපුම් සිදුවීමක් ලෙස ද ප්‍රකාශ කර ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## <u>B කොටස</u>

### ප්‍රශ්න අංක 02

නිසි ගිණුම් වාර්තා පවත්වාගෙන නොගිය ව්‍යාපාරික ආයතනයක ප්‍රාග්ධනය (ස්කන්ධය) / ශේෂය සහ ශුද්ධ ලාභය ගණනය කිරිම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්නය ලබා දී ඇත. සමහර අයදුම්කරුවන් ස්කන්ධ ශේෂය නිවැරදිව ගණනය කර නොතිබුණි.

පහත සඳහන් හේතුන් නිසා සමහර අපේක්ෂකයින් හොඳින් පිළිතුරු දී නොතිබුණිඃ

(1) ඔවුන් ණයපත් මගින් ලැබිය යුතු අවසන් මුදල් ශේෂය නිසි ලෙස ගණනය කර නැත. කෙසේ වෙතත්, අවසන් ණය ලැබිය යුතු දේ සැලකිල්ලට නොගෙන වසර සඳහා ශුද්ධ ලාභය භාවිතා කර ස්කන්ධය ගණනය කළ හැක.

(2) ලාභ සූත්‍ර ක්‍රමය භාවිතයෙන්, අවසාන ස්කන්ධය ගණනය කිරීමේදී සමහර අයදුම්කරුවන් විසින් ආරම්භක ස්කන්ධය නිවැරදිව සලකා බලා නොමැත.

(3) දළ ලාභ අනුපාතය නිවැරදිව සැලකිල්ලට නොගැනීම හේතුවෙන් විකුණුම් පිරිවැය වැරදි ලෙස ගණනය කර ඇත.

(4) වර්ෂය සඳහා ක්ෂයවීම් නොසලකාහැර ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

### ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නය මගින් හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් සහ ලාභ හෝ අලාභ විසර්ජන ගිණුම සකස් කරන්නේ කෙසේද යන්න පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කර ඇත. බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා ප්‍රමාණවත් ලකුණු ලබාගෙන තිබුණි.

නමුත් පහත සඳහන් හේතුන් මත සමහර අයදුම්කරුවන් හොඳින් පිළිතුරු සපයා නොතිබුණිඃ

(1) සමහර අයදුම්කරුවන් ගිණුම්ගත නොකල ගොඩනැගිලි කුලිය සහ ණය පොලී ශුද්ධ ලාභය රු. මිලියන 8 ට නොගලපා ඇත. එබැවින් එක් එක් හවුල්කරුවන්ගේ ලාභ විසර්ජනය නිවැරදි නොවේ.

(2) සමහර අයදුම්කරුවන් විසින් ගොඩනැගිලි කුලිය සහ ණය පොලී හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්වල සටහන් කර නොමැත.

(3) ඇතැමුන් ප්‍රාග්ධන ගිණුම්වල ආරම්භක ශේෂයන් ජංගම ගිණුමට ඇතුලත් කර ඇත.

(4) සමහරු හවුල්කරුවන්ගේ වාර්ෂික වැටුප වෙනුවට මාසික වැටුප සලකා බලා ඇත.

(5) ජංගම ගිණුම්වල හර සහ බැර ශේෂය නිවැරදිව සැලකිල්ලට ගෙන නැත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 04

ලාභ නොලබන සංවිධානයක ආදායම් සහ වියදම් ගිණුම සහ ලැබීම් සහ ගෙවීම් ගිණුම සකස් කිරීම මෙම ප්‍රශ්නයෙන් අසන ලදී.

නිරීක්ෂණය කරන ලද පොදු වැරදි පහත පරිදි වේ:

(1) සමහර අයදුම්කරුවන් විසින් සාමාජික මුදල් ගිණුම නිවැරදිව සකස් කර නොතිබූ අතර එකී ගිණුමට අදාළ හර සහ බැර සටහන් කිරීම් නිසි ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(2) වසර තුළ අලුතින් සම්බන්ධ වූ වෛද්‍යවරුන් 10 දෙනෙකු සඳහා සාමාජික මුදල ගණනය කිරීම සැලකිල්ලට ගෙන නොමැත.

(3) වර්ෂය සඳහා ක්ෂයවීම් නිසි ලෙස ගණනය කර නොතිබූ අතර, සමහර අයදුම්කරුවන් විසින් ආදායම් සහ වියදම් ගිණුමටද ක්ෂයවීම් අයකර නොතිබුණි.

(4) නිකුත් කරන ලද ශල්‍ය ද්‍රව්‍ය බෙහෙත් පිරිවැය ගණනය කිරීමේදී ආරම්භක තොග සහ අවසන් තොග නිසි ලෙස සැලකිල්ලට ගෙන නොමැත

(5) ලැබුණු පරිත්‍යාග නිවැරදිව ගිණුම්ගත කර නොතිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 05

**(a)** පොදු කාර්ය ප්‍රතිපාදනය සහ දෙපාර්තමේන්තුවලට විභජනය කිරීම පිළිබඳ ප්‍රකාශනයක් සකස් කරන ලෙස ඉල්ලා සිටි අතර බොහෝ අයදුම්කරුවන් හොඳින් පිළිතුරු ලබා දී තිබුණි. සමහර අයදුම්කරුවන් වෙතින් දෙපාර්තමේන්තු සඳහා වක්‍ර ද්‍රව්‍ය වෙන් කිරීම මඟ හැර ඇත. තවත් අයදුම්කරුවන් කිහිප දෙනෙකු සේවා දෙපාර්තමේන්තු පිරිවැය නිෂ්පාදන දෙපාර්තමේන්තු වලට බෙදා නොමැත.

**(b)** එක් එක් දෙපාර්තමේන්තු සඳහා පොදු කාර්ය අවශෝෂණ අනුපාතය ගණනය කිරීමට ප්‍රශ්නය අසන ලද අතර බොහෝ අයදුම්කරුවන්ගේ කාර්ය සාධනය ඉතා සතුටුදායක විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 06

**(a)** ලබා දී ඇති දත්ත මත පදනම්ව, යම් කාර්යයක් සඳහා අය කළ යුතු මිල ගණනය කිරීම අවශ්‍ය වූ අතර බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්නයට වෙන් කර ඇති සම්පූර්ණ ලකුණු ප්‍රමාණයම ලබා ගෙන තිබුණි. කෙසේ වෙතත්, විකුණුම් මිල මත ලාභ ආන්තිකය ගණනය කිරීම සමහර අයදුම්කරුවන් විසින් සිදු කර නොමැති බව සඳහන් කල යුතුය.

**(b)** ඇඟලුම් කම්හලකට අනුයුක්ත සේවකයෙකුගේ මුළු ඉපැයීම් ගණනය කරන ලෙස ඉල්ලා සිටි අතර අයදුම්කරුවන් බහුතරයක් මුළු ඉපැයීම් නිවැරදිව ගණනය කර නොතිබුණි. ඔවුන් ප්‍රසාද දීමනා නිවැරදිව ගණනය කර නොමැත. ඉතිරි කරන ලද කාලය මත පදනම්ව ප්‍රසාද දීමනා ගණනය කළ යුතුය. ප්‍රසාද දීමනා ගණනය කිරීමේදී ඔවුන් ඉතිරි කළ කාලය වැරදි ලෙස ගණනය කර ඇත.

බොහෝ අයදුම්කරුවන් ප්‍රසාද දීමනාව නිවැරදිව ගණනය කර නොමැති බව නිරීක්ෂණය විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොතිබුණි.**

## C කොටස

### ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නය පුද්ගලික සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම පරීක්ෂා කරන ලද අතර එය **(a)** සහ **(b)** කොටස් 2 කින් සමන්විත වේ. **(a) කොටසින්** විස්තීරණ ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීම පරීක්ෂා කරන ලද අතර **(b) කොටස** මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය පිළියෙළ කිරීම පරීක්ෂා කරන ලදී.

බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට පිළිතුරු දීමට උත්සාහ කර ඇති අතර සමහර අයදුම්කරුවන්ට සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට හැකි විය.

පහත දුර්වලතා නිරීක්ෂණය විය:

**(a) විස්තීරණ ආදායම් ප්‍රකාශනය සකස් කිරීම:**

(1) ආදායම් ප්‍රකාශනය සහ මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය සඳහා සාමාන්‍යයෙන් පිළිගත් ආකෘති ඉතා සුළු අපේක්ෂකයින් පිරිසක් විසින් අනුගමනය කර නොමැත.

(2) සමහර අයදුම්කරුවන් විසින් ආදායම් බදු ගැලපීම නිවැරදිව සිදු කර නොතිබුණි.

(3) මෝටර් වාහන ඉවත් කිරීම සඳහා ගිණුම් තැබීම සමහර අයදුම්කරුවන් විසින් සිදු කර නොතිබූ අතර එම නිසා, මෝටර් වාහන ඉවත් කිරීමේ ලාභය සමහර අයදුම්කරුවන් විසින් ගිණුම්ගත කර නොතිබුණි. සමහර අයදුම්කරුවන් ඉවත් කිරීමේදී ලාභය නිවැරදිව සළකා ඇතත්, නව මෝටර් රථවල ක්ෂයවීම් නිවැරදිව සැලකිල්ලට ගෙන නොමැත.

(4) සමහර අයදුම්කරුවන් පෙරවැඩ අමුණා නොතිබූ අතර, එබැවින්, ඔවුන්ට පෙරවැඩ සඳහා වෙන් කර ඇති තවත් ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට නොහැකි විය.

(5) තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් වඩා අඩු අගයට ගිණුම්ගත කළ යුතුය. සමහර අපේක්ෂකයින් එය සැලකිල්ලට ගෙන නැත.

(6) සමහර අයදුම්කරුවන් විසින් වර්ෂය සඳහා අදාළ පොළිය ගණනය කර නැත.

**(b) මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය සකස් කිරීම:**

(1) මෝටර් රථය එකතු කිරීම් නිවැරදිව හඳුනා ගෙන නොමැත. වර්ෂය සඳහා ක්ෂයවීම් නිවැරදිව ගණනය නොකිරීම හේතුවෙන්, ධාරණ අගය වැරදි විය.

(2) සමහර අපේක්ෂකයින් බොල් ණය සහ බොල් ණය සඳහා ප්‍රතිපාදන වෙළඳ ලැබිය යුතු මුදල් වලින් අඩු කර නොතිබුණි.

(3) ජංගම සහ ජංගම නොවන වත්කම් සහ වගකීම්වල නිවැරදි වර්ගීකරණයන් සිදුකර නොමැත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

\- - -

**විභාගයේදී කාර්යසාධන මට්ටම වැඩිදියුණු කරගැනීම සඳහා අයදුම්කරුවන්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සඳහා යෝජනා:**

(1) ස්ව-අධ්‍යයන පාඩම් මාලා හොඳින් අධ්‍යයනය කර ඒවායේ අන්තර්ගත කරුණු තේරුම්ගත යුතුය.

(2) කළ යුතු ක්‍රියා පද නිර්වචනයන් තේරුම් ගැනීම සහ ප්‍රශ්න පත්‍රය අවසානයේ දී ඇති කළ යුතු ක්‍රියා
පරීක්ෂා ලැයිස්තුව මත පදනම්ව ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පුහුණු විය යුතුය.

(3) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර වල අන්තර්ගත කරුණු අධ්‍යයනය කර අවම වශයෙන් ප්‍රශ්න පත්‍ර 2-3 කටවත් පිළිතුරු සැපයීමට පුහුණු වී ප්‍රශ්න ඉදිරිපත් කරන ආකාරය අවබෝධ කර ගත යුතුය.

(4) විභාගයට පෙර නියමිත කාලය වෙන් කරගෙන පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර වලට පිළිතුරු සපයා පුහුණු වීම මගින් විභාගයේදී කාලය කළමණාකරණයට ඉවහල් වේ.

(5) විභාගයේදී කියවීමට හැකි ආකාරයෙන් අත් අකුරු පැහැදිලිව ලිවිය යුතුය.

(6) ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම ආරම්භ කිරීමට පෙර, ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවා බැලිය යුතුය.

(7) ප්‍රශ්න හොඳින් තේරුම්ගෙන ගැලපෙන හා නිවැරදි පිළිතුරු සැපයීම සඳහා විභාගය අවස්ථාවේදී පැහැදිලි මනසක් පවත්වා ගත යුතුය.

(8) එක් එක් ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය අනුව පිළිතුරු සැපයීමට ගත කළ යුතු කාලය වෙන් කර ගත යුතු අතර එමගින් සියළු ප්‍රශ්න සඳහා කාර්යක්ෂමව පිළිතුරු සැපයීමට හැකි වනු ඇත.

(9) පිළිතුරු පොත් භාරදීමට පෙර, අවශ්‍ය කරන සියළු ප්‍රශ්න වලට පිළිතුරු ලියා තිබේද, නිසි පරිදි අංක යොදා තිබේද ආදිය දෙවරක් පරීක්ෂා කර බැලිය යුතුය.

- * * * -